# ස්වීඩන විදේශ ඇමතිනී මාර්ගෝ වෝල්ස්ට්‍රෝම් මහත්මිය සමඟ පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාවෙන් පසු විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් නිකුත් කල මාධ්‍ය ප්‍රකාශය

අද දින උදෑසන ශ්‍රී ලංකාව වෙත සපැමිණි ස්වීඩන විදේශ ඇමතිනී මාර්ගෝ වෝල්ස්ට්‍රෝම් මහත්මිය ඉමහත් ගෞරවයෙන් යුතුව පිළිගනු කැමැත්තෙමි. මෙම සංචාරය, මීට වසරකට පෙර අප අතර ජිනීවා හිදී පැවති සාකච්ඡාත් ස්වීඩන අගමැති ස්ටීවන් ලෝවන් මහතා සමඟ ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාත් අගමැති රනිල් වික්‍රමසිංහ මහතාත් බොආඕ සංසදයේ දී පවත්වන ලද සාකච්ඡාත්, ලෝක ආර්ථික සමුළුවත් සමඟ පිළිවෙලින් සහසම්බන්ධ වේ.

1990 දශකයේ තම පවුලේ සාමාජිකයන් ද සමඟ මෙහි දිවි ගෙවූ සහ රැකියාවක ද නිරත වූ විදේශ අමාත්‍ය වෝල්ස්ට්‍රෝම් මහත්මිය ශ්‍රී ලංකාවට අමුත්තියක නොවේ. ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදය, සංහිඳියාව හා සංවර්ධනය උදෙසා වූ නව මාවතක් කරා අවතීර්ණ වී ඇති මෙවන් වූ පරිවර්තනීය අවස්ථාවක දී වෝල්සරෝම් මහත්මියගේ ශ්‍රී ලංකා සංචාරය අතිශයින් වැදගත් වන්නේයැයි මා විශ්වාස කරමි.

අද දින ඇයගේ සපැමිණීම හොඳම ප්‍රජාතන්ත්‍රීය සම්ප්‍රදායන් පිළිපදින, සියළු ජාතීන්ගේ මානව හිමිකම් සුරකින සහ ප්‍රවර්ධනය කරන, අප සමාජයට ආවේනික බහු-ජාතික, බහු-සංස්කෘතික, බහු-ආගමික සහ බහු-භාෂික භාවය අගයන, සැබවින්ම සාමකාමී, ප්‍රතිසන්ධානය වූ, සමෘද්ධිමත් ජාතියක් බවට අප රට පත් කිරීම සඳහා අප විසින් ආරම්භ කර ඇති ගමන සඳහා වන ආශීර්වාදයක් කොට සලකමි.

කාන්තා අයිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා වර්තමාන ලෝකය විසින් ගනු ලබන උත්සාහයන්හිදී වෝල්ස්ට්‍රෝම් මහත්මිය විසින් දරනු ලබන නිරන්තර නායකත්වය ද මෙහිලා සිහිපත් කරනු වටී. වර්තමානය වනවිට මෙම ක්ෂේත්‍රය තුල ශ්‍රී ලංකාව ද ඉදිරියට යමින් සිටී. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයන්හි දී කාන්තා නියෝජනය 25% දක්වා ඉහල නැංවීමට අප තීරණය කර ඇති අතර නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තා අයිතීන් වඩාත් ප්‍රවර්ධනය කරනු ඇත. මෙම ක්ෂේත්‍රයේ ලා ස්වීඩනය සමඟ වැඩිදුරටත් සහයෝගයෙන් කටයුතු කිරීමට අප අදහස් කරන අතර එක්සත් ජාතීන්ගේ සමුළුවලදී සහ අනෙකුත් බහුපාර්ශ්වීය තලයන්හිදී දේශගුණික විපර්යාස ඇතුළු වෙනත් විශ්වීය වශයෙන් වැදගත්කමක් ඇති කරුණු පිළිබඳ ව ද සාකච්ඡා කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු.

අද වනවිට ශ්‍රී ලංකාව තමන් විසින් පනවා ගෙන තිබූ ස්වයං හුදෙකලා තත්වයෙන් මිදී ඉන්දියන් සාගර මධ්‍යයේ වූ තම භූගෝලීය පිහිටීම නිසා පමණක් නොව අප රටේ ජනතාව විසින් උදාකරගෙන ඇති වෙනස හේතුවෙන් ද ලෝක ප්‍රජාවගේ අවධානය දිනා ගනිමින් සිටී.

නමුත් අපට තව බොහෝ දුර යා යුතුව ඇත. අප විසින් දිනාගත් දෑ මත නැගීසිටීමට ද, අපගේ ජනතාවගේ සිහින සැබෑ කරවීමට ද අපට ජාත්‍යන්තර ප්‍රජාවගේ සහය අවශ්‍ය වේ. අතීතයේ සැක සංකා හා අගතීන්ගේ පසු බැසීම වෙනුවට දැන් අප අපගේ අනාගතය සිහින හා බලාපොරොත්තු මත නිර්මාණය කිරීම අරඹා ඇත්තෙමු.

ඒ අනුව, මෙම වෙනස්කම් සහ සාමකාමීභාවය තුලින් අප රටේ ජනතාවට ප්‍රතිලාභ අත්කරදීම තහවුරු කිරීම සම්බන්ධයෙන් සාමූහිකව කටයුතු කිරීමට අද දින සාකච්ඡාවේ දී අප දෙරට අතර එකඟතාවයක් ඇති විය. සංවර්ධන සහය, ද්විපාර්ශ්වික වෙළඳාම, සංචාරක කර්මාන්තය හා ආයෝජනය වැඩිදියුණු කිරීම යනාදී ක්ෂේත්‍රයන් ඔස්සේ අප දෙරටේ සබඳතා ශක්තිමත් කරගැනීම සම්බන්ධයෙන් ද අප සාකච්ඡා කළෙමු. විශේෂයෙන්ම, පසුගිය වසර පනහක කාලය තුල කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය ද ඇතුළුව ස්වීඩනය විසින් අප රටේ සංවර්ධන කාර්යයන් සඳහා ලබාදුන් අඛණ්ඩ සහයෝගය මෙහි ලා

ස්තූතිපූර්වකව සිහිකරනු කැමැත්තෙමි. තවද ස්වීඩනයේ ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ යළි ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳව ද මෙහිදී අපි සාකච්ඡා කළෙමු.

ස්වීඩනයේ විශාලතම සමාගම් නියෝජනය කරන ඉහල මට්ටමේ වෙළඳ හා ආයෝජන දූත පිරිසක් ද වෝල්ස්ට්‍රොම් මහත්මිය සමඟ ශ්‍රී ලංකාවට පැමිණීම අප විශේෂයෙන් අගය කරන්නෙමු. ශ්‍රී ලංකාව තුළ දැනටමත් ස්වීඩන ආයෝජන ව්‍යාපෘති 21ක් ක්‍රියාත්මක වෙමින් පවතී. අප විසින් චීනය වැනි නැගී එන ආර්ථිකයන්ට අමතරව ඉන්දියාව හා පාකිස්ථානය සමඟ දැනට පවත්වා ගෙන යන නිදහස් වෙළඳ ගිවිසුම් වර්ධනය කර ගනිමින් ඉන්දියානු උප මහද්වීපයට ඇති වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කර ගැනීමට මෙන්ම චීනය වැනි නැගී එන රටවල් සමගද නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමට අප සාකච්ඡා කරමින් සිටින හෙයින් උප මහාද්වීපයට හා ඉන්දියානු සාගර සීමාවට ප්‍රවේශ විය හැකි දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව මෙම දූත පිරිසේ අවධානයට ලක් වෙනු ඇතැයි මම විශ්වාස කරමි.

නැගී එන වෙළෙඳපොළ වෙත ප්‍රවේශයට අමතරව, සංවර්ධිත වෙළඳපලවල් තුළ ද අපගේ ස්ථාවරය තහවුරු කරගැනීමට අපි කටයුතු කරමින් සිටිමු. එක්සත් ජනපද වෙළඳපල වෙත තවදුරටත් සහනදායී ප්‍රවේශය ලබාගැනීම වෙනුවෙන් වන සාකච්ඡා සඳහා වන වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ එකඟතා කමිටුවේ රැස්වීමකට සහභාගී වීම සඳහා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා මේ වනවිට වොෂින්ටනය බලා ගොස් සිටී. යුරෝපා කොමිසම විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය සඳහා පනවා තිබූ තහනම ද දැන් ඉවත් කර ඇති අතර නුදුරේදීම යුරෝපා වෙළඳපලට සහනදායී ප්‍රවේශය ලබා ගැනීම සඳහා වූ GSP+ සහනයද නැවත ලබාගැනීමට හැකිවනු ඇතැයි ද අපි විශ්වාස කරමු.

තවද, ජූනි මාසය වනවිට වඩාත් කාර්යක්ෂම, ආයෝජන සඳහා හිතකර, ගතික හා සුරක්ෂිත ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඉවහල් වන වැදගත් පනත් රැසක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. එවිට ශ්‍රී ලංකාව සැබවින්ම ව්‍යාපාර සඳහා විවෘත වනු ඇත.

වෝල්ස්ට්‍රොම් මහත්මිය තම සංචාරය අතරතුර ජනාධිපති සිරිසේන මහතා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහ වෝල්ස්ට්‍රොම් පාර්ලිමේන්තුවේ කථානායකවරයා ද මුණගැසීමට අදහස් කරන අතර යාපනයේ ද සංචාරය කිරීමට බලාපොරොත්තු වේ. මම ඇයට සහ ඇයගේ දූත පිරිසට ප්‍රීතිමත් ශ්‍රී ලංකා සංචාරයක් පතමි.